# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1775/1 – 2012 සැප්තැම්බර් 10 වැනි සඳුදා – 2012.09.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: 3/2/1/132.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසියපත්තුවේ සුළු කොට්ඨාසයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි අංක 101, වඩුමුල්ල ග්‍රාම නිලධාරි වසමෙහි වඩුමුල්ල ගමේ ගම්පහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක ගම් 3843 සහ 2012.06.28 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දක්වා ඇත.

**කැබලි අංක 01**

ඉඩමේ නම: නාවින්නවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: ටෙක්ලා අයිරින් චන්ද්‍රලේඛා, නො. 01, වඩුමුල්ල, දෙවලපොල; ප්‍රමාණය: හෙක්. 0.0734.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ.ව. 10.00ට මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 සැප්තැම්බර් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. එල් ගම්මම්පිල,
ප්‍රාදේශීය ලේකම්,
මිනුවන්ගොඩ.

2012 අගෝස්තු මස 22 වැනි දින,
මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 707

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: 1/5/අත්/233.
03ජේ/82/අයිආර්/124.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

වයඹ පලාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිණියම කෝරළයේ, පහල මලත්තව ගමේ පිහිටි අ.ග.පි. 1435, අතිරේක අංක 02හි සඳහන් මලත්තව වැව වැඩිදියුණු කිරීම සඳහා රජයට අත්පත් කරගන්නා ඉඩම් කැබලි (03),

**කැබලි අංක 19**

ඉඩමේ නම: මලත්තව වත්ත; විස්තරය: පොල් ඉඩම, අවු. 30-40 වයසැති පොල් ගස් 03කි; හිමිකම් කියන අය: ජෝශප් "ද ක්‍රිශාන්", පමුණුගම, ජාඇල; ප්‍රමාණය: හෙක්. 0.469.

**කැබලි අංක 20**

ඉඩමේ නම: මලත්තව වත්ත; විස්තරය: පොල් ඉඩම, අවු. 30-40 වයසැති පොල් ගස් 14කි; හිමිකම් කියන අය: දිලානි ජෝශප් "ද ක්‍රිශාන්", පමුණුගම, ජාඇල; ප්‍රමාණය: හෙක්. 0.515.

**කැබලි අංක 21**

ඉඩමේ නම: බුලනගාව හේන්යාය; විස්තරය: පොල් ඉඩම, අවු. 30-40 වයසැති පොල් ගස් 68කි; හිමිකම් කියන අය: හේවා විසෙන්ති, ඔලුපැලියාව වත්ත, වීරපොකුණ; ප්‍රමාණය: හෙක්. 0.806.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 නොවැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10.00ට බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 නොවැම්බර් මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එම්. ඩී. සෝමරත්න,
ප්‍රාදේශීය ලේකම්,
බිංගිරිය.

2012 අගෝස්තු මස 14 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

09 - 731

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.